MOD/DEF/08/05/GEN/2013


තැ. පෙ. / த. பெட்டி / P. O. Box 572

දුරකථන / தொலைபேசி / Telephone 1430860-9, 1430870-8

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව.

பாதுகாப்பு, நகர அபிவிருத்தி அமைச்சு, இல. 15/5, பாலதக்ஷ மாவத்தை, கொழும்பு 03, இலங்கை.

MINISTRYOF DEFENCE & URBAN DEVELOPMENT, No. 15/5, Baladaksha Mawatha, Colombo 03, Sri Lanka, ministry@defence.lk


දිනය / திகதி / Date 2014.02.26

යුද්ධ හමුදාධිපති,

නාවික හමුදාධිපති,

ගුවන් හමුදාධිපති,

**<u>ක්‍රියාන්විත හේතූන් මත වෛද්‍ය වර්ග කිරීම්වලට ලක් වූ නිළධාරීන්/සෙසු නිලයින් සියළු වරප්‍රසාද සහිත ව සේවයෙන් මුදවාහැරීම.</u>**

යොමුව - (අ) . අමප/1982/305 (09) හා 1982.07.28 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව

02. නීතිය ක්‍රියාත්මක කිරීමේ රාජකාරිවල නිරත ව සිටිය දී ත්‍රස්තවාදී ක්‍රියා හේතු කොට ගෙන ආබාධික තත්ත්වයට පත් වූ සන්නද්ධ සේවා සහ පොලිසි නිළධාරීන් වෙත යොමුව 'අ' දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් මාසික වැටුප් හා දීමනා ලැබීමට හිමිකම් ඇත.

03. ඒ අනුව ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් තුවාල ලබා අවුරුදු 5/12 සහ 20/22 සේවය සම්පූර්ණ කර දැනටමත් අස්ව ගොස්/විශ්‍රාම ගොස් ඇති අයවළුන් නැවත වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියට පමුණුවා ඔවුන් ස්ථිර දුබලතාවයට පත්වී ඇත්නම් එම අයවළුන් සඳහා යොමුව 'අ' දරණ ලිපියට අනුව පහත සඳහන් පරිදි ඉදිරි කටයුතු සිදු කල යුතුය.

- අ. නිළධාරී/සෙසු නිළයින් හට ඔවුන්ගේ වයස අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා හිමි ගැන්වීම.
- ආ. දුබලතා ප්‍රතිශතය මත වන්දි මුදල් හිමි ගැන්වීම.
- ඇ. දුබලතා විශ්‍රාම වැටුප් හිමිකම ලබන අයවළුන් හට 85% උපරිම විශ්‍රාම වැටුප් ප්‍රතිශතය මත මාසික විශ්‍රාම වැටුප දැනටමත් හිමි ගන්වන්නේ නම් එවැනි අයවළුන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශතය නැවත වැටුප් හා දීමනා හිමි ගන්වන දින සිට අදාල පරිදි අඩු කර ගෙවීම.
- ඈ. අදාළ අයවළුන් වෙත මීට පෙර වෙනත් වන්දි මුදලක් හිමි ගන්වා ඇත්නම් එය අය කර ගැනීම.

04. එබැවින් යොමුව 'අ' දරණ අමාත්‍ය මණ්ඩල ලිපිය අනුව වැටුප් හා දීමනා හිමි ගන්වන අයවළුන් වෙත හිඟ ගෙවීමකින් තොරව 2014.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෛද්‍ය මණ්ඩල වාර්ථා පදනම් කරගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එස්.හෙට්ටිආරච්චි
අතිරේක ලේකම් (ආරක්ෂක)
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට